


# කළණ මිතුරු දහමයි





සිසිර දිසානායක

**සැලෙන්නේ නො පිරුණු කළයේ දියමය. සපිරුණු කළයේ දියනම් නො සැලෙන්නේ මය. සොච්චමක් කර කප්පරක් කළා සේ හිස උදුම්මවාගත් පුහු දනන් අතරේ කප්පරක් කර සොච්චමක්වත් නොකළා සේ නිහතමානීව මුව කමල පුබුදුවන ප්‍රවීණයකු හා සාමීචියේ යෙදෙන්නට වාසනාවන්ත වීමු අපි. ශිල්ප හා දැනුම සම්භාරයෙන් සපිරුණා වූද නිරහංකාරත්වයේ සිනා කමලින් මුව සැරසුණා වූද පුන් කලසක් නොවේද සංගීත්වේදී ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ?**

**"1948 අවුරුද්දේ තමයි මම මුල්ම චිත්‍රපටයට ගිවිසුම් අත්සන් කළේ. සංවිධානයේ දුර්වලකම් නිසා ඒ චිත්‍රපටිය තිඹිරිගෙයිම නතර වුණත් එක සින්දුවක් කළා. ස්වතන්ත්‍ර නිර්මාණ කරන්න මගේ තිබුණ ආශාව නිසා විවිධ පුවත්පත් වල ලිපි ලිය ලිය ඉන්නකොට ක්‍රමයෙන් චිත්‍රපටවලට ඉල්ලුම් ගලා ආවා"**

සැලෙන්නේ නො පිරුණු කළයේ දිය ම ය. සපිරුණු කළයේ දියනම් නො සැලෙන්නේ මය. සොච්චමක් කර කප්පරක් කළා සේ හිස උදුම්මවාගත් පුහු දනන් අතරේ කප්පරක් කර සොච්චමක්වත් නොකළා සේ නිහතමානීව මුව කමල පුබුදුවන ප්‍රවීණයකු හා සාමීචියේ යෙදෙන්නට වාසනාවන්ත වීමු අපි. ශිල්ප හා දැනුම සම්භාරයෙන් සපිරුණා වූද නිරහංකාරත්වයේ සිනා කමලින් මුව සැරසුණා වූද පුන් කලසක් නොවේද සංගීත්වේදී ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ? කෙටි කලකට හෝ එතුමන්ගේ සමාගමය ලැබීමට තරම් වාසනාවන්ත වූවෝය මෙල්බර්න් රසිකයෝ.

ගීයක පසුබිම රසවිඳි "ගී සඳැළුව" පාඨකයනට මෙවර කියැවීම සඳහා ලියැවෙන්නේ ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ නිර්මාණවලියේ පසුබිම පිළිබඳවයි. අපි කියවමු එතුමාණන්ගේ වදනින්ම කියැවුණ දේ....

"1948 අවුරුද්දේ තමයි මම මුල්ම චිත්‍රපටයට ගිවිසුම් අත්සන් කළේ. සංවිධානයේ දුර්වලකම් නිසා ඒ චිත්‍රපටිය තිඹිරිගෙයිම නතර වුණත් එක සින්දුවක් කළා. ස්වතන්ත්‍ර නිර්මාණ කරන්න මගේ තිබුණ ආශාව නිසා විවිධ පුවත්පත් වල ලිපි ලිය ලිය ඉන්නකොට ක්‍රමයෙන් චිත්‍රපටවලට ඉල්ලුම් ගලා ආවා"

1948 යනු ශ්‍රී ලංකාව නිදහස ලැබුවා වූ වර්ෂයයි. ඉන්දියානු සංගීතයටත්, බටහිර ආභාෂයේ සංගීත ක්‍රමවලටත් හුරුව තිබුණු රසිකත්වය ස්වත්නත්‍ර නිර්මාණවලින් අවදි කරවන්නට මුල පිරූ පුරෝග ාමියෙකු වීය ප්‍රේමරත්නයන්.

විමලවීර මාස්ටර්ගේ චිත්‍රපටියක් ලැබුණා. ඒ "එක් දවසක් රෑ" කියන චිත්‍රපටිය. ඊට පස්සේ "ගැහැණු ගැටේ", "මා ආලය කළ තරුණිය" වගේ එක එක විදිහේ චිත්‍රපටවලට සංගීත අධ්‍යක්ෂණය කරන්න ආරාධනා ලැබුණා. සුවිශේෂී චිත්‍රපටියක් විදියට මට "හිතක පිපුණ මල් " චිත්‍රපටියේ අවස්ථාව ලැබුණා. අධ්‍යක්ෂණය එස්. රාමචන්ද්‍රන් මහත්තයා. ඒ චිත්‍රපටියේ සිංහල කොටසකුයි ඉංග්‍රීසි කොටසකුයි තියෙන සින්දුවක් නන්දා මාලිනී මහත්මියයි ඩැල්රින් ආර්නෝල්ඩා මහත්මියයි ගැයුවා. සිංහල ගීතයයි ද්‍රවිඩ ගීතයයි යොදන්න අවස්ථාව ලැබුණා. සංගීත් නිපුන් පී. වී. නන්දසිරි මහත්තයා ගායනා කලා " කමලාසිනී" කියන හංස ධ්වනියෙන් නිර්මාණය වුණ ගීතය. මේ ගීත අදටත් උචිතයි."

"ගී සඳැළුව" ලිපිය සම්පාදක වන මාගේ පෞද්ගලික ජීවිතයේ සුවිශේෂී සිද්ධියක් පිළිබඳව මෙහිදී සටහන් තබනුයේ ඒ පසුබිමේ වූ දැවැන්ත සෙවනැල්ල ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ වූ නිසාවෙනි. ඉන් ඊට මට අවසර....

එවකට පස්වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබමින් සිටි මාගේ උපන් දිනයක් වෙනුවෙන් මාගේ මව්පියන් මාද සමගින් කිංස්ලි රාජපක්ෂ අධ්‍යක්ෂණය කළ කළණ මිතුරෝ චිත්‍රපටය නැරඹීම සඳහා ගියහ. මිතුරන් දෙදෙනෙකු පිළිබඳව කියවුණ චිත්‍රපටියකි ඒ. එකෙකු අන්ධ තරුණයෙකි. අනෙකා පයක් අහිමිව ගිය තරුණයෙකි. මේ ආබාධිත තරුණයින් එකෙකු ගී ගයමින්ද අනෙකා "මවුත් ඕගනය" වයමින්ද උපයාගන්නා මුදලින් තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන ගිය කතා පුවතයි රිදී තිරයේ දිග හැරුණේ. තිස්ස විජේසුරේන්ද්‍ර රංගන ශිල්පියාගේ ප්‍රථම රංගනය අඳ චරිතයයි. අනෙක් මිතුරා වූයේ වික්‍රම බෝගොඩ ශිල්පියා යි. ගායක තරුණයා වෙනුවෙන් ගැයුණු "දිනෙක යන මෙතැන සිටන් නික්මී, උපන් කාට උනත් මේ චංචල ලෝකේ", "කළණ මිතුරු දහමයි", "භවෙන් භවය", "මහමෙර සාගර" යන ගීත පහම ගැයූ ශිල්පියා වූයේ වික්ටර් රත්නායකයන්. ඒ සුමධුර තනුවලින් හා ගැයුම්වලින් අමන්දානන්දයට පත් වූ මා ගී උම්මත්තකයෙකු බවට පත් වීමි. එම ගීත සියල්ලෙහි තනු හා සංගීත රචකයාණන් වූයේ ෂෙල්ටන් ප්‍රේමරත්නයන් ය. පදරචනාවන් කරුණාරත්න අබේසේකර හා ඔගස්ටස් විනයාගරත්නම් ප්‍රවීණ පද රචකයන් විය. අද මා කලා කෙතෙස කෙනෙක් යම් දුරක් පැමිණ ඇත්නම් ඒ පසුබිමෙහි ප්‍රේමරත්නයන් ද වේ. ගීතනාත් කුඩලිගමයන්ගේ "මාරුතය මියුරු සර" ග්‍රන්ථය වෙනුවෙන් වික්ටර් රත්නායකයන් මෙලෙසින් අදහස් දක්වන්නේය;

"ඒ වගේ ම ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ හමුවීමත් මගේ ගායන දිවියේ වෙනස්කම් රැසකට බලපෑවා. ගුවන්විදුලියේ තමයි මට ෂෙල්ටන් ප්‍රේමරත්නයන් මුලින් ම හමු වුණේ."

"කළණ මිතුරෝ ගීත ගායනයට ප්‍රවිෂ්ඨ වීමත් සමඟ ම කලා ක්ෂේස්ත්‍රයන්හි කවදත් පවතින නවකයා දුටු තැන "කැපිල්ල" එදත් සිදු වුණා."

ඒ දිනවල පැවති දැවැන්ත ප්‍රතිරූප හමුවේ නොසැලී නවක තමා හට අවස්ථාව ලබා දීම පිළිබඳව දිගින් දිගටම විස්තර කරන්නේය රත්නායකයන්.

මේ " කළණ මිතුරෝ " පිළිබඳව ප්‍රේමරත්නයන්ගේ වචනයෙන්....

"මුලින් ම ලයනල් අල්ගම ශිල්පියාට ලැබිලා පස්සේ මට පැවරුණා. මං නිශ්පාදකවරයට කිව්වා මේ චිත්‍රපටියේ ඔක්කොම දේවල් ස්වතන්ත්‍ර නිර්මාණ කෙරෙනවනම් පමණයි මං සම්බන්ධ වෙන්නෙ කියලා. ඉතින් වික්ටර් රත්නායක මහත්මයව යොදා ගත්තා ගීත ගායනා කරන්න; මොකද නිර්මල, ලයාන්විත, හිත උණුවෙන විදිහේ හඬක් තියෙන නිසා. "කළණ මිතුරෝ ", "දෝස්ති" නම් වූ හින්දි සිනමා පටයේ කතාව අනුවම කෙරුණා වූ නිපැයුමක් ඊට ස්වතන්ත්‍ර නිර්මාණ එක්කරමින් අපේ හුරුව කැවීමෙහිලා ප්‍රේමරත්නයන් කළා වූ මෙහෙවර අතිශයින් ම අගනේය. තවදුරටත් ඒ පිළිබඳ මතකය අවදිකළ ප්‍රේමරත්නයන්....

"හැම තිස්සේම මගේ වාදක මණ්ඩලය සම්පූර්ණ වාදක මණ්ඩලයක්. මම කරන හැම නිර්මාණයකදීම ක්ෂණයට කම්පන වාර දහසේ ඉඳන් විසි දාහ තෙක් එක විදියට සූදානම් කරනවා. පියානෝ එකේ මුල් "රීඩ්" එකේ ඉඳන් අවසාන "රීඩ්" එක වෙනකල් නාද එන්න පුළුවන් වෙන විදයට. ඒ තරම් වාද්‍ය ශිල්පීන් එක්ක වැඩකරන කොට එන තාක්ෂණික ගැටළු තිබුණා. පියවි කනට ඇහෙනවා වගේ නෙවෙයිනේ පටිගත වෙලා ආවම. ඇත්තටම ඒ ගැටළු දැන් නෑ.

ප්‍රේමරත්නයන් සිය පුතනුවන් වූ අග්‍රා ප්‍රේමරත්න දෙස බලමින් පැවසුවා. අග්‍රා සතුව තිබූ ශබ්දාග ාරයක්ද ඇති අතර ඔහු තරුණ සංගීත ශිල්පියෙකි.

"චිත්‍රපටි ගීතවලට බොහෝ විට "මවුත් ඕගන්" භාණ්ඩය වාදනය කළා. වාදනය කළේ මර්වින් ප්‍රියන්ත ශිල්පියා. එයත් දක්ෂ ශිල්පියෙක්. ඇත්තටම චිත්‍රපටියේ නම දුන්නෙත් මම මයි. බටනලාව යොදාග න්නවට වඩා අළුත් දෙයක් කරන්න මට ඕන වුණා. "මවුත් ඕගන්" එක යොදා ගත්ත නිසයි චිත්‍රපටියත් ඒ විදියට දර්ශනගත කළේ. ඇත්තට ඒක රූපගත කිරීම්වලට පහසුවක් වුණා. බටනලා වයන්නෙකුගේ සමහර කැමරා කෝණවල නොග ැලපීම් එන්න තිබුණා. අනික බටනලාව පිඹිනකොට සුළං හඬ පටිගත වෙනවා. "මවුත් ඕගන්" එක පිඹින්නෙත් සුළංවලින් වුණාට සමස්ත "කෝඩ්" එක ම වාදනය වෙන නිසා අර සුළං හඬ යටපත් වෙනවා.

චිත්‍රපටිය නිර්මාණය කළාට පස්සේ තිරයේ දාලා පෙන්වනවා පසුබිම් සංගීතය හදන්න. ඒ දර්ශන අනුව හිතට එන දේ තමයි පසුබිම් සංගීතය විදියට නිර්මාණය කෙරෙන්නෙ. එවෙලෙම ස්වර සටහන් හදලා වාදක මණ්ඩලයට දෙනවා. මොනවා කළත් අන්තිමට සංස්කරණයේදී නිශ්පාදක, අධ්‍යක්ෂක වගේ අයගෙ " ඕනකම්වලට අනුව සමහර කොටස් ඉවත් වෙනවා. එතන තියෙන්නෙ ඒකාධිකාරියක්." ප්‍රේමරත්නයන් අප හමුවේ තවත් බොහෝ දෑ තැබීය.

සැබැවින්ම ඒ දේ වඩාත් උචිත වන්නේ වෙනම ම ලිවිය යුතු ශාස්ත්‍රීය ලිපියකටයි. එවන් ලිපියකට කරුණු රඳවාගනිමින් මෙලෙසින් නිමාව දකින්නෙමු.

මේ වන විට ෂෙල්ටන් ප්‍රේමරත්නයන් පිළිබඳව බොහෝ දෑ ලියවී ඇත්තේය. එනයින් එතුමන් නැවත හඳුන්වා දීමට ඉඩ වෙන් නො කළෙමු අපි. පාඨක ඔබ ඊට උරණ නොවනු ඇතැයි සිතන්නෙමු.